# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2383/26 – 2024 මැයි මස 08 වැනි බදාදා – 2024.05.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2024 අංක 61 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/10/2016/LRB/504.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී යොමු අංකය: WGSWD&EIP/ACQ/KB/41.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 අප්‍රේල් මස 10 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** වේරැස්ගඟ වැසි ජලය අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය.

2. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 578A, කටුවාවල දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කටුවාවල (බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/DSO/2020/393 හා 2023.05.25 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

1. **කැබලි අක්ෂර 'A' – මුත්තෙට්ටුවේ ඕවිට – ප්‍රමාණය: හෙක්. 0.0325**

උතුරට: අම්බලන් ඇළ සහ මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.) සහ නහිල් එදිරිසිංහ හිමිකම් කියන මුත්තෙට්ටුවේ ඕවිට; දකුණට: නහිල් එදිරිසිංහ හිමිකම් කියන මුත්තෙට්ටුවේ ඕවිට සහ දයාවංශ අල්විස් හිමිකම් කියන මුත්තෙට්ටුවේ ඕවිට; බටහිරට: දයාවංශ අල්විස් හිමිකම් කියන මුත්තෙට්ටුවේ ඕවිට සහ අම්බලන් ඇළ.

EOG 05 – 0065



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2024 අංක 63 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/24/2021/J/253.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: DS/GFG/L&L/05/137.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්,* එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 මැයි මස 06 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.–** ප්‍රාදේශීය ලේකම්, ගාල්ල - කඩවත් සතර.

2. **ඉඩමේ විස්තරය.–** දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 98, මඩවලමුල්ල දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මඩවලමුල්ල දකුණ (කැඩැස්තර සිතියම් අංක 810023, කලාප අංක 03, පත්‍ර අංක 1) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/GFG/2021/545 හා 2022.02.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් දැක්වෙන ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – හයින්ස් බර්ග් *හෙවත්* කයිනෝස් බර්ග් *හෙවත්* හයින්ස්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.3658**

උතුරට: කැබලි අංක 90 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B; නැගෙනහිරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B සහ ක.සි. 810038 (ශ්‍රී හේමානන්ද මාවත); දකුණට: ක.සි. 810038 (ශ්‍රී හේමානන්ද මාවත), කැබලි අංක 116, 97, 96, 95, 94, 93 සහ 92; බටහිරට: කැබලි අංක 116, 97, 96, 95, 94, 93 සහ 92.

02. **කැබලි අක්ෂර 'B' – හයින්ස් බර්ග් *හෙවත්* කයිනෝස් බර්ග් *හෙවත්* හයින්ස්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.3510**

උතුරට: කැබලි අංක 90 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර C; නැගෙනහිරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර C සහ ක.සි. 810038 (ශ්‍රී හේමානන්ද මාවත); දකුණට: ක.සි. 810038 (ශ්‍රී හේමානන්ද මාවත) සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර A; බටහිරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර A සහ ක.සි. 810023 හි කැබලි අංක 90.

03. **කැබලි අක්ෂර 'C' – හයින්ස් බර්ග් *හෙවත්* කයිනෝස් බර්ග් *හෙවත්* හයින්ස්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.4214**

උතුරට: කැබලි අංක 90, 84, පත්‍රය 2 (මූපිග 2352) සහ කැබලි අංක 121; නැගෙනහිරට: පත්‍රය 2 (මූපිග 2352), කැබලි අංක 121 සහ ක.සි. 810038 (ශ්‍රී හේමානන්ද මාවත); දකුණට: ක.සි. 810038 (ශ්‍රී හේමානන්ද මාවත) සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B; බටහිරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B සහ ක.සි. 810023 හි කැබලි අංක 90 සහ 84.

EOG 05 – 0066

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.